## සවියෙන් පෙරට අපි එකට

## e -ඉගෙනුම් පාසල

## හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂය | වාරය | පාඩම |
|---|---|---|---|
| 7 | සිංහල | පළමුවන වාරය | (1-පාඩම)ගොවි බිරියගේ නුවණ |


පී.වී.හිමාලි තුෂාරිකා

බප/හො/ශ්‍රී සිද්ධාර්ථ ක.වි

සුන්දර කතන්දර ඇසීමට අපි සැවොම ආශා කරමු.සීයා අත්තම්මා අපට කියා දුන්

එවන් රසබර **ජන කතාවක මිහිර විඳිනට**

# “ගොවි බිරියගේ නුවණ”

# කියවමු.



**ජන කතාවක ස්වභාවය හා පසුබිම හඳුනා ගනිමු.**

* ජනකතා ජනප්‍රවාද ලෙස කටින් කට පැවත ගෙන එයි.

* ජනකතා සවන් දී රස විඳිය හැකි සාහිත්‍යාංගයකි.

(ආච්චී සීයා විසින් අපට රස කර කියන ජනකතා සිහියට නඟා ගනිමු.)

*ජන කතාව කියන්නා සහ අසන්නා අතර මනා සම්බන්ධයක් පවත්වාගෙන යන තරමට එය අපට තව තවත් සමීපව රස විඳිය හැකිය.

නිදු- අත්තම්මා එකෝමත්තෙක කාලෙක බොහෝ ම විශාල වනාන්තරයක ගොඩාක් නපුරු ව්‍යාඝ්‍රයෙක් හිටියා....(අත්තම්මාගේ මුහුණ තුළ පුදුමය , බිය දනවන හැඟීම් අපට දැකිය හකි විය.අපි ද එයට පහත පරිදි ප්‍රතිචාර දකවමු.

නිද - ගොඩක් විශාල වනානතරයක් ද? ව්‍යාඝ්‍රයා ගොඩක් නපුරු ද? යනාදී වශයෙන්......

*ජනකතාවලින් සමාජයට ආදර්ශයන් සපයයි.

## අපි දැන් ගොවි බිරියගේ නුවණ කතාව අධ්‍යනය කරමු.

*මෙය පකිස්ථානු ජනකතාවකි.(ජපපානයේ යුනෙස්කෝ ආසියානු සංස්කෘතික මධ්‍යස්ථානය විසින් පළ කරන ලද **Folk tales from Asia for Children Every where –Book Two** නම් ග්‍රන්ථයේ සිංහල පරිවර්තනයයි.)

*නුවණක්කාර ගොවි බිරිදකගේ ක්‍රියා කලාපය නිසා සිදු වීමට ගිය විශාල විනාශයක් නවත්වා ගැනීමට හැකිවූ අයුරු අපට පැහැදිලි වෙයි.

*සමාජයේ අන් අය රැවටීමට උත්සාහ කරන්නන් ට අවසානයේ දරුණු ඉරණමකට මුහුණ පෑමට සිදුවන බව ද  අපට මේ තුළින් පෙන්වා දෙයි. (හිවලාට අවසානයේ දී මරණය අත්වීම.)

*අපි ගතින් කුඩා වුවත්  චින්තනයෙන් පොහොසත් නම් අපට ඕනෑම අභියෝගයකට මුහුණ දීමට හැකි බව අපට පෙන්වා දෙයි.

“ගොවි ගොයගේබිරි නුවණ” ජන කතාවේ අපට හමුවන චරිත -





*ගොවියා

*ගොවි බිරිය

*ව්‍යාඝ්‍රයා

*හිවලා





ඔබත් ජනකතා කියවා රස විදින්න.ඒවායේ ආදර්ශ වටහා ගන්න.







- නඟුල් මුන්නා සහ තවත් කතා(ඒ.පී ගුණරත්න)
- මඟ දිගට ජනකතා (ඩී.පී. වික්‍රමසිංහ)
- මහදැනමුත්තාගේ කතන්දර








## ප්‍රස්තාව පිරුළු හා ඉඟි වැකි

ඕනෑම සමාජයක ඔවුන්ගේ ජීවන වෘත්තීන්,සිරිත් විරිත්, ඇදහීම්, සිතුම් පැතුම්,ආකල්ප ආදිය මත පදනම්ව ගොඩ නැගුණු භාෂා ව්‍යවහාරයන් පවතී.එම ව්‍යවහාර මත පදනම්ව ගොඩනැගුණු යෙදුම් විශේෂය සාම්ප්‍රදායික යෙදුම් වශයෙන් හඳුන්වයි.

සාම්ප්‍රදායික යෙදුම් ප්‍රධාන වශයෙන් වර්ග තුනක් හඳුනා ගත හැකිය.

*ප්‍රස්තාව පිරුළු
*රූඪී හෙවත් ඉඟි වැකි
*යුගල පද

ප්‍රස්තාව පිරුළු -

කථා කිරීමේ දී සහ ලිවීමේ දී අවස්ථාව ට අනුව කිසියම් කාරණයක් පැහැදිලි කිරීම උදෙසා භාවිත කෙරෙන පොදු කියමන් විශේෂයකි.

# ප්‍රස්තාව පිරුළුවල විශේෂ ලක්ෂණ -

* තැනට ඔබින කියමන් විශේෂයකි
*කිය යුතු කරුණක් ,
කෙටියෙන්
පැහැදිලි ව
රසවත් ව ඉදිරිපත් කළ හැක.

*ප්‍රස්තාව පිරුළු බොහෝ විට කතන්දර ඇසුරෙන් නිර්මාණය වී ඇත.

# කතන්දර ඇසුරෙන් නිර්මාණය වී ඇති ප්‍රස්තාව පිරුළු










*අබරා සිල් ගත්තා වගේ

*කළුවා මාරපන ගියා වගේ

*පුහුල් හොරා කරෙන් දැනේ

*ගමරාල දිව්‍ය ලෝකෙ ගියා වගේ

## උපදේශාත්මක ස්වරූපයේ පිරුළු-

*අනුන්ට කළ දේ තමන්ට පල දේ
*පනින්ට පෙර සිතා බලනු.
*උත්සාහ වන්තයා ජය ගනියි.
*ඉවසීමෙන් සැනසීම ලැබේ.

## රූඪී-

මතුපිට අර්ථය නැතහොත් වාච්‍යාර්ථය ඉක්මවන වෙනත් අර්ථයක් ප්‍රකාශවන යෙදුම් විශේෂයකි.මේවා ඉඟි වැකි ලෙස ද දුන්ව යි.

* තරු පෙනුණා(අනපේක්ෂිත ගැටලුවකට මුහුණ දීම)
*කුකුළා අතින් අරන්(උදෑසනින්ම)
*කරල පැහුණා (වාසියක් සිදු වීම)
*බළලා මල්ලෙන් එළියට පැනීම(සැඟවීමට උත්සාහ ගත් දෙයක් එළිදරවු වීම.